# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2149/5 - 2019 නොවැම්බර් මස 11 වැනි සඳුදා - 2019.11.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය :* IR/15/31/2008

### කාර්මික ආරාවුල් පනත - 131 වැනි අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2017.12.26 දිනැති හා අංක 2051/10 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2017.12.19 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් ගම්පහ, බණ්ඩාරවත්ත, නාගහවත්ත පාර, අංක 59/ඒ 7 හි පදිංචි එස්. ඒ. එන්. ප්‍රියදර්ශනී මෙනවිය සහ කොළඹ 07, නිදහස් චතුරශ්‍රයෙහි පිහිටි ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2019.09.16 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 නොවැම්බර් මස 01 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

කාර්මික අධිකරණය

එස්. ඒ. එන්. ප්‍රියදර්ශනී,
අංක 59/ඒ 7,
නාගහවත්ත පාර.
බණ්ඩාරවත්ත පාර,
ගම්පහ

නඩු අංකය : ඒ/51/2017
IR/15/31/2008

*ඉල්ලුම්කාරිය*

*එදිරිව*

ශ්‍රී ලංකා රූපවාහිනි සංස්ථාව,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07

*වගඋත්තකාර පාර්ශවය*

වර්ෂ 2019ක් වූ සැප්තැම්බර් මස 16 වැනි දින දීය,

**බලතල පැවරීම**

ඉහත සඳහන් පාර්ශවයන් අතර පවත්නා ආරාවුල කම්කරු, වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න මහතා 1957 අංක 14 සහ 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 හා 1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවිය යුතු පනත් වලින් සංශෝධිත වූ ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් එතුමා වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරුවෙකු වශයෙන් වර්ෂ 2017ක් වූ දෙසැම්බර් මස 11 වැනි දින මා වෙත යොමු කොට තිබේ.

**උද්ගතව පවත්නා කාර්මික ආරාවුල**

වර්ෂ 1993 දෙසැම්බර් මස සිට ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ කාර්මික නිලධාරිනියක් වශයෙන් සේවය කළ එස්. ඒ. එන්. ප්‍රියදර්ශනී යන අයට රූපාවාහිනි සංස්ථාවේ ඉංජිනේරු අංශයේ නඩත්තු ඒකකයේ දී සිදු වුවා හැයි කියන ගැටළු නිසා සිවිල් ඉංජිනේරු ඒකකයට ස්ථාන මාරු කළ ද විසඳුමක් නොදීමෙන් ඇති වුවා යැයි කියන මානසික ගැටළු හේතුවෙන් හා ඇය එකඟ නොවූ වන්දි මුදලක් ගෙවා වෛද්‍ය නිර්දේශ මත ඇයගේ සේවය අවසන් කිරීමෙන් ඇයට අසාධාරණයක් සිදු වී තිබෙන බව පැමිණිලිකාර පාර්ශවයේ ස්ථාවරය වන අතර එකී පැමිණිලිකාරිය සේවය සඳහා තව දුරටත් යෝග්‍ය මානසික තත්ත්වයක් නොදරන බැවින් හා වෛද්‍ය මණ්ඩල නිර්දේශයන් මත ඇය සේවයෙන් විශ්‍රාම ගැන්වීමට සිදු වූ බවත් ඉන් ඉක්බිතිව ඇය වෙත හිමිවිය යුතුව තිබූ සියලු ව්‍යවස්ථාපිත දීමනා ඇතුළු අනෙකුත් දීමනාවන් ද ඊට අමතර වශයෙන් සානුකම්පිතව සලකා බලා සාධාරණ වූ වන්දි මුදලක් ද ගෙවන ලද බව වගඋත්තරකාර පාර්ශවයේ ස්ථාවරය විය. ඒ අනුව පැමිණිලිකාරියට අසාධාරණයක් සිදු වී තිබේ ද ? එසේ අසාධාරණයක් සිදු වී තිබේ නම් ඇයට හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳව පරික්ෂා කර බලා ප්‍රදානයක් කිරීම හෝ නොකිරීම මෙම අධිකරණයේ කාර්ය භාරය වී තිබේ.

**පාර්ශවයන්ගේ කරුණු දැක්වීම්**

ඉහත සඳහන් කාර්මික ආරවුල සම්බන්ධයෙන් වූ නඩුව විභාගයට ගැනීමට පූර්වයෙන් 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනතේ අංක 39 දරන ආඥාව යටතේ 1959 මාර්තු මස 02 වැනි දිනැති අංක 11688 දරන *රජයේ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 1969 කාර්මික ආරාවුල් පනත යටතේ නියෝග සංග්‍රහයේ 21(1) දරන නියෝගය පරිදි මෙකී ආරාවුලට හේතු වූ කරුණු කාරණා සම්බන්ධයෙන් පාර්ශවයන් වෙතින් විස්තර ප්‍රකාශ ඉල්ලා සිටි අතර පැමිණිලිකාර පාර්ශවය මෙන්ම වගඋත්තරකාර පාර්ශවය විසින් ද එහි දී ලිඛිතව කරුණු ඉදිරිපත් කර තිබේ.

**පාර්ශවයන්ගේ එකඟතාවයන් :**

පැමිණිලිකාර පාර්ශවය විසින් හා වගඋත්තරකාර පාර්ශ්වය විසින් ඉදිරිපත් කරනු ලැබූ ලිඛිත කරුණු සැලකිල්ලට ලක් කිරීමේදී මෙම ආරාවුල සම්බන්ධයෙන් පාර්ශවයන් අතර කිසියම් වූ එකඟතාවයන් පවත්නා බව නිරීක්ෂණය කළෙමි. ඒවා පහත දැක්වෙන පරිදි සාරාංශ කර දැක්විය හැකිය. එනම්,

01. පැමිණිලිකාරිනිය වර්ෂ 1993ක් වූ දෙසැම්බර් මස 01 වැනි දින සිට රූපවාහිනී සංස්ථාවේ සේවයට බැඳුණු බව,
02. රූපවාහිනී සංස්තාවේ ඉංජිනේරු ඒකකයට අයත් නඩත්තු ඒකකයේ කාර්මික නිලධාරිනියක වශයෙන් සේවයේ යෙදී සිටි බව,
03. පැමිණිලිකාරිනිය සේවයේ කරමින් සිටිය දි රෝගී තත්ත්වයට පත්ව ඒ සඳහා විශේෂිත නිවාඩු පවා ලද බව,
04. පැමිණිලිකාරිනියගේ රෝගී තත්ත්වය සළකා වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයක් වෙත යොමු කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඇය සේවය සඳහා තවදුරටත් නුසුදුසු තැනැත්තියක බවට නිර්දේශ වූ බව,
05. නිසි විශ්‍රාම වයස එළඹීමට පෙරාතුවම පැමිණිලිකාරිනියගේ රෝගී තත්ත්වය මත ඇය 2010.03.01 වැනි දින සිට විශ්‍රාම ගන්වන ලද බව,
06. එසේ විශ්‍රාම ගැන්වීමේ දී ඇයට හිමි විය යුතුව තිබූ සියළු ව්‍යවස්ථාපිත දීමනා මෙන්ම වෙනත් දීමනා ද ඇය වෙත නිසි පරිදි ගෙවන ලද බව හා ඒවා ලද බව,
07. ඊට අමතර වශයෙන් පැමිණිලිකාරිය කෙරෙහි සානුකම්පිතව සලකා බලා වන්දි සූත්‍රයට අනුකූලව සකසන ලද වන්දි මුදලක් වශයෙන් රුපියල් හත් ලක්ෂ විසි අටදහස් එකසිය අනූවක (රු. 7,28,190.00) මුදලක් ගෙවන ලද බව හා එය ලද බව,

**විසඳිය යුතු ප්‍රශ්න :**

01. වගඋත්තරකාර ආයතනයේ කිසියම් ක්‍රියාකාරකමක් හෝ නොකර හැරීමක් නැතහොත් නොසළකා හැරීමක් මත පැමිණිලිකාරිනිය රෝගී භාවයට පත්වී ද යන්න,
02. එසේ නැතහොත් වගඋත්තරකාර ආයතනයට වළකා ගත නොහැකි වූ හේතුන් මත එනම් ස්වභාවික හෝ වෙනත් හේතුන් මත ඇය රෝගි තත්ත්වයට පත් වූයේ ද යන්න,
03. පැමිණිලිකාරිනිය විශ්‍රාම ගන්වනවා වෙනුවට වෙනත් විකල්ප ක්‍රියාමාර්ගයක් පැවතියේ ද යන්න,
04. පැමිණිලිකාරිනිය විශ්‍රාම ගැන්වීමෙන් පසුව ඇය වෙත සහන සැලසීම සඳහා වූ අනුමත කාර්ය පරිපාටින් වගඋත්තරකාර ආයතනය සතු වී ද යන්න,
05. පැමිණිලිකාරිනියට යම් අසාධාරණයක් සිදුව තිබේද ? එසේ නම් ඇයට හිමිවිය යුතු සහන කවරේද යන්න වේ.

මෙම විසඳීම් සඳහා නඩු විභාගය ආරම්භ කිරීමට ප්‍රථමයෙන් කිසියම් වූ සමථයක් පවතින්නේ ද යන්න පිළිබඳව පාර්ශවයන් වෙතින් විමසූ අවස්ථාවේ දි පැමිණිලිකාර පාර්ශවය විසින් ඉදිරිපත් කරන්නට යෙදුනු සමථය වගඋත්තරකාර පාර්ශවය පිළිනොගත් අතර සංශෝධයන්ගෙන් තොරවම එය ප්‍රතික්ෂේප කරනු ලැබීය. එම නිසා නඩුව විභාග කිරීමට තීරණය කළෙමි. ඒ අනුව මෙම නඩුව වර්ෂ 2018 ක් වූ ජූලි මස 30 වැනි දින විභාගයට ගත් අවස්ථාවේ

දී වගඋත්තරකාර පාර්ශවය විසින් මූලික විරෝධතා තුනක් ඉදිරිපත් කරන ලද්දේ ය. ඒවා නම්,

I. පැමිණිලිකාරිනිය 2010.03.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි විශ්‍රාම ගන්වා ඇති බැවින් ඇය හා ආයතනය අතර සේව්‍ය සේවක සම්බන්ධතාවයක් නොපවත්නා බැවින් මෙම නඩුව පවරා පවත්වා ගෙන යාමට හැකියාවක් නොමැති බව.

II. පැමිණිලිකාරිනියගේ සේවය නීත්‍යානුකූල ආකාරයෙන් අවසන් කර මේ වන විට වසර අටක් ගතව තිබිය දී නීති විරෝධී හා පදනම් විරහිතව වගඋත්තරකාර පාර්ශවය අපහසුතාවයට පත් කිරීමේ චේතනාවෙන් මෙම අයදුම් පත්‍රය ඉදිරිපත් කර ඇති බැවින් එය නිශ්ප්‍රභ කළ යුතු බව.

III. පැමිණිලිකාරිනියගේ ශාරිරික හා මානසික තත්ත්වයන් සළකා වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ මත ඇය විශ්‍රාම ගන්වා තිබීමෙන් ඇයට සානුකම්පිතව සළකා වන්දි මුදලක් මේ වන විටත් ලබා දී තිබෙන බැවින් තවදුරටත් ඒ පිළිබඳව කටයුතු කිරීමට අවශ්‍ය නොවන බව.

ඉහත සඳහන් වගඋත්තරකාර පාර්ශ්වයේ මූලික විරෝධතා නැතහොත් මුල් විරෝධතා දෙක පිළිබඳව නීතිමය තත්ත්වය පැහැදිලි කර දෙමින් ඒවා ප්‍රතික්ෂේප කරන ලද අතර තෙවන විරෝධතාවය පිළිබඳව නඩුව විභාග කිරීමෙන් තොරව තීන්දු ප්‍රකාශයක් ලබා දිය නොහැකි බවට අධිකරණය විසින් කරුණු දක්වන ලදී. ඉන් ඉක්බිතිව නඩු විභාගය ආරම්භ කරන ලද අතර එහි දී ප්‍රථමයෙන් සාක්ෂි මෙහෙය වීම සඳහා පැමිණිලිකාර පාර්ශවයට අවස්ථාව දෙනු ලැබීය.

ඒ අනුව පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂි ලබා දුන් ඉල්ලුම්කාරිය තමන් වර්ෂ 1993 දෙසැම්බර් මස 01 වැනි දින සිට පුහුණු වන කාර්මික සහකාර නිලධාරිනියක් වශයෙන් සේවයට බැඳී පසුව 1994.12.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි 4බී ශ්‍රේණියේ කාර්මික නිලධාරි තනතුරට පත් වීම් ලද බව ද එසේ සේවය කළ තමා වර්ෂ 2010 මාර්තු මස 01 වැනි දින දක්වාම සේවයේ නිරත වූ බව ද ප්‍රකාශ කර සිටියා ය. වර්ෂ 2010 පෙබරවාරි මස ඒකාබද්ධ වැටුප රු. 25,370.00ක් වූ බව ද ජීවන වියදම් දීමනා රු. 5,250.00ක් ආහාර දීමනාව රු. 450.00ක් හා ගැලපුම් දීමනාව රු. 1000.00ක් වශයෙන් එකතුව රු. 32,070.00ක් ලද බව ඇය වැඩිදුරටත් ප්‍රකාශ කර සිටියා ය. මූලික සාක්ෂි විමසීමේදි ඇය අසන ලද ප්‍රශ්නයකට එනම්, (2018.09.04 දිනැති සාක්ෂි සටහනෙහි 13 වන පිටුව).

ප්‍ර : දැන් නමුත් ගරු අධිකරණයට ප්‍රකාශ කළා තමුන් රූපවාහිනී සංස්ථාවේ සේවය කරන කාලය තුළ යම් කිසි ආසාධාරණ වලට හා තාඩන පීඩන වලට ලක් වුණා කියලා. ඒ මොකක් ද කියලා පැහැදිලි කරන්න ගරු අධිකරණයට ?

උ : මා ඉංජිනේරු අංශයේ නඩත්තු ඒකකයේ කාර්මික නිලධාරිනියක වශයෙන් සේවය කළා. 2010 අවසාන භාගයේ මා හට එම ඒකකයේ නිලධාරීන් බැන වදිමින් සොරකු යැයි කියමින් පයින් ගසමින් මාගේ බෑගයට ආයතනයට අදළ උපකරණ දමා ආරක්ෂක නියාමක අංශයට අල්ල දීමට උත්සහා කළා. මා සතු එම ඒකකයේ ලාච්චුව කඩා සියලු ලිපි ලේඛන සොරා ගෙන තිබුණා'' යනුවෙන් පිළිතුරු ලබා දී ඇත. මෙම නඩුව ආරම්භයේ දීම පැමිණිලි පාර්ශවය මෙන්ම වගඋත්තරකාර පාර්ශවය ද ඉල්ලුම්කාරිය 2010.03.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි විශ්‍රාම ගන්වන ලද බව පිළිගෙන තිබේ. එසේ තිබිය දී 2010 අවසාන භාගයේ දී තමාට ඉංජිනේරු ඒකකයේ නිලධාරින්ගෙන් තාඩන පීඩන වූ බවට ඉල්ලුම්කාරිය කරනු ලබන ප්‍රකාශය සාවද්‍ය වූ එකක් බව අවිවාදිත කරුණකි. එහි දී වැඩිදුරටත් ඇය සාක්ෂි ලබාදෙමින් ප්‍රකාශ කර සිටියේ එම අංශයේ සේවයේ නිරතව සිටි වෙනත් කිසිදු අයෙකුට එවැනි තත්ත්වයක් උද්ගතව නොපැවති බව ය. ඉංජිනේරු අංශයේ නිලධාරීන් වෙතින් තමන් වෙත තාඩන පීඩන එල්ල වීම සම්බන්ධයෙන් කළමනාකරණය වෙත හෝ වෙනත් ආයතනයක් වෙත හෝ ඇය විසින් ඒ පිළිබඳව ඉදිරිපත් කරන ලද කිසිදු ලේඛණයක් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට ඇය අසමත් වූවා ය. එපමණක් ද නොව ඇය තමාගේ අවසාන සේවා කාලය තුළ සේවයේ නිරතව සිට ඇත්තේ ඉංජිනේරු අංශයේ නඩත්තු ඒකකයේ නොව සිවිල් ඉංජිනේරු ඒකකයේ බව ද ඇය ගෙන් අසන ලද ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් ඇය ප්‍රකාශ කර තිබේ. (2019.09.04 දිනැති සාක්ෂි සටහනෙහි 20 වන පිටුව).

උ : 2006.03.03 දින සිට ඉංජිනේරු අංශයේ නඩත්තු ඒකකයේ සේවයේ කළ මා සිවිල් ඉංජිනේරු ඒකකයට යොමු කළා වාචිකව''

(2019.09.04 දිනැති සාක්ෂි සටහනෙහි 22, 24 හා 26 පිටු)

ප්‍ර : දැන් ඔය ස්ථාන මාරුව දෙන කොට තමුන්ගේ දැනුම අනුව යම් කිසි රෝගී තත්ත්වයක් තිබුනා ද ?

උ : නෑ, 2006.03.03 දක්වා හොඳින් රාජකාරි කළා.

එහි දී තවත් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් ඇය පහත පරිදි කරුණු දක්වා තිබේ.

උ : නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉංජිනේරු) මට විරුද්ධව ඉංජිනේරු අංශය තුළ මාව තියා ගන්න බෑ කියලා අධ්‍යක්ෂ ජෙනරාල්ට පැමිණිලි කරලා තිබුණා.

ප්‍ර : දැන් මෙම වගඋත්තරකාර ආයතනය තමුන්ගේ කිසියම් වරදක් නැතිව තමුන්ව සේවයෙන් විශ්‍රාම ගැන්වුවා එහෙම ද කියන්නේ ?

උ : ඔව්

ප්‍ර : එම විශ්‍රාම ගැන්වීම තමුන් කියන්නේ සාධාරණ නැහැ කියලා ?

උ : ඔව්

ප්‍ර : දැන් තමන් පිළිගන්නේ නැද්ද වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයකට ඉදිරිපත් කරලා වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලය විසින් තමුන් සේවය සඳහා සුදුසු නොවන බව නිර්දේශ කළා කියලා පිළිගන්නවා ද නැද්ද ?

උ : පිළිගන්නවා

තවද ඉල්ලුම්කාරිය වගඋත්තරකාර ආයතනයේ සේවයට බැඳෙන අවස්ථාවේ දී වෛද්‍ය පරීක්ෂණයකට භාජනය වූ බව ද ඇය සාක්ෂි දෙමින් ප්‍රකාශ කර තිබේ. (2019.09.04 සාක්ෂි සටහන් අනුව)

ප්‍ර : සේවයට බැඳුනේ කවදා ද ?

උ : 1993

ප්‍ර : තමන් සේවයට බැඳෙන කොට වෛද්‍ය පරීක්ෂණයකට භාජනය වුණා ද ?

උ : ඔව්

ඒ අනුව ඉල්ලුම්කාරිය සේවය සඳහා පත්වීම් ලැබීමේ දී සුදුසු සෞඛ්‍ය තත්ත්වයකින් සිටි බව පැහැදිලි වන්නේ මේ පිළිබඳව වගඋත්තරකාර පාර්ශවය හබ කිරීමක් සිදු කර නොමැති පසුබිමක් තුළ ය. කෙසේ වෙතත් ඉල්ලුම්කාරිය සම්බන්ධයෙන් අර්බුදකාරී තත්ත්වයක් උද්ගත වන්නේ වර්ෂ 2005 න් පසු කාලය තුළ බවත් එය 2006 හා 2010 මුල් මාස දෙක තුළ උත්සන්න තත්ත්වයකට පත්ව තිබෙන බවත් ඉදිරිපත් වුණු කරුණු මත නිරීක්ෂණය කළෙමි. වගඋත්තරකාර ආයතනය විසින් ඉල්ලුම්කාරිනිය වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයක් වෙත යොමු කිරීම සඳහා මුලින්ම පියවර ගෙන ඇත්තේ වර්ෂ 2009 අප්‍රේල් මස 06 දිනැති ලිපියක් මගින් බව පෙනී යයි. එම ලිපිය ඒ - 8 වශයෙන් සලකුණු කර තිබේ. ඉල්ලුම්කාරිය ඉංජිනේරු අංශයේ නඩත්තු ඒකකයේ සිටි සිවිල් ඉංජිනේරු අංශය වෙත 2006 මාර්තු මාසයේ දි ස්ථාන මාරු කිරීමට හේතු වූ කරුණු පිළිබඳව වගඋත්තරකාර පාර්ශවය මෙන්ම පැමිණිලිකාර පාර්ශවය ද නඩු විභාගයේ දී සාධක සහිතව කරුණු ඉදිරිපත් කිරීමට අසමත් වී තිබේ. එම ස්ථාන මාරුව ක්‍රමවත් බවකින් තොරව වාචිකව කරන ලද අභ්‍යන්තර ස්ථාන මාරුවක් බව ද පැහැදිලි වේ. මෙම ස්ථාන මාරුව හේතු කර ගෙන තමා රෝගී තත්ත්වයට පත් වූ බවක් ඇගවීමට ඉල්ලුම්කාරිය සාක්ෂි ලබා දීමේ දි උත්සහ ගෙන තිබුණ ද එය ඍජුව හා සාධක සහිතව තහවුරු කිරීමට ඇය අසමත් වී තිබේ. (2019.09.04 දිනැති සටහනෙහි 22 හා 24 පිටු).

ප්‍ර : දැන් ඔය ස්ථාන මාරු දෙන කොට තමුන්ගේ දැනීම අනුව යම් කිසි රෝගී තත්ත්වයක් තිබුණා ද ?

උ : නෑ. 2006.03.03 දක්වා හොඳින් රාජකාරි කළා.

ප්‍ර : ස්ථාන මාරු ලියුමක්වත් නැතිව ?

උ : ඔව්, එතැන ගිහින් ඉන්න කියලා කීවේ.

ප්‍ර : කිසිම වැඩක් කළේ නැහැ

උ : ඔව් 2005 ඉඳන් 2010 වෙනකම් කිසිම රාජකාරියක් නැහැ. උදේ එනවා හවස යනවා.

ඉල්ලුම්කාරියගේ ඉහත සාක්ෂිය අනුව පැහැදිලි වන කරුණක් වන්නේ 2005 වර්ෂයේ සිට ඇය කිසිම රාජකාරි කටයුත්තක නොයෙදුන බවය. එසේ නම් ඇය සිවිල් ඉංජිනේරු අංශය වෙත 2006.03.03 දින ස්ථාන මාරු කිරීම මත ඇය රෝගී තත්ත්වයට පත් වූවා යැයි තීරණය කළ නොහැකිය. මන්ද යත් 2005 වර්ෂයේ සිට 2006 මාර්තු මස 02 වැනි දින දක්වා ඇය ඉංජිනේරු අංශයේ නඩත්තු ඒකකයේ සේවයේ යොදවා සිටි බැවිනි. එම කාලය තුළ ද ඇය කිසිම රාජකාරියක නොයෙදුන බව ඇයම ප්‍රකාශ කොට තිබේ.

**ප්‍රදානය :**

මෙම සියලු කරුණු සැලකිල්ලට ගෙන බැලීමේ දී පෙනී යන්නේ වගඋත්තරකාර ආයතනයේ කිසියම් ක්‍රියාකාරකමක් හෝ නොකර හැරීමක් නැතහොත් නොසලකා හැරීමක් මත ඉල්ලුම්කාරිය රෝගී තත්ත්වයට පත් වූ බවට සාධක සහිතව තහවුරු නොවන බවයි. එම නිසා ඉල්ලුම්කාරියගේ රෝගී තත්ත්වය වගඋත්තරකාර ආයතනයට වළකා ගත හැක්කක් නොවන බවට තීරණය කරමි.

මීළඟට අවධානය යොමු කළ යුතු කරුණක් වන්නේ ඉල්ලුම්කාරියගේ රෝගී තත්ත්වය ස්වභාවික හේතූන් මත සිදු වූයේ ද නැතහොත් වගඋත්තරකාර ආයතනයට වළකා ගත නොහැකි වූ ඇයටම පෞද්ගලික වූ හේතූන් මත ඇති වූවක් ද යන්න පිළිබඳව ය. මේ සම්බන්ධයෙන් නඩු විභාගයේ දී පැමිණිලිකාර පාර්ශවය වෙතින් ද කිසිදු කරුණු ඉදිරිපත් කිරීමක් හෝ සාධක ඉදිරිපත් කිරීමක් සිදු නොවීය. ඒ සඳහා වන වඩාත් වැදගත්ම සාධකය වූ වෛද්‍ය පරීක්ෂණ මණ්ඩල වාර්තා වෙතින් ද (ආර් - 2 වශයෙන් සලකුණු කරන ලද ලේඛනය) ඇයගේ රෝගී තත්ත්වයට හේතු වූ කරුණු කිසිවක් හෙළිදරව් නොකරයි. එබැවින් අධිකරණයට ඒ පිළිබඳව කිසිදු ස්ථාවරයක් ගෙන හැර දැක්වීමේ හැකියාවක් නොමැති බවට තීරණය කරමි. ඉල්ලුම්කාරිනිය වර්ෂ 2006 මාර්තු මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගන්වන ලද බව දෙපාර්ශවයම පිළිගන්නා ලද කරුණකි. වගඋත්තරකාර පාර්ශවය විසින් ආර් - 5 වශයෙන් සළකුණු කරන ලද වෛද්‍ය පරීක්ෂණ මණ්ඩල වාර්තාවේ රෝග ලක්ෂණ වශයෙන් සඳහන් කර ඇත්තේ දෙඅත් වෙව්ලීමයි. එහිම රෝග විනිශ්චය වශයෙන් දක්වෙන්නේ ''පාර්කින්සන් ඩිසීස් '' යන්නයි. එහි වැඩිදුරටත් සඳහන්ව ඇත්තේ නිලධාරිනිය තව දුරටත් සේවය සඳහා සුදුසු නොවන බවය. ඒ කෙසේ වුව ද වගඋත්තරකාර ආයතනය විසින් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කරන ලද අංක රුවා/1/3/124 දරන හා 2009.04.06 වැනි දිනැති ලිපිය සම්බන්ධයෙන් සලකා බලන විට පැහැදිලි වන කරුණක් වන්නේ ඇය රෝගී තත්ත්වයෙන් මුදා ගැනීම සඳහා වගඋත්තරකාර ආයතනය විසින් ගන්නා ලද උත්සාහයන් වශයෙනි. එය පැමිණිල්ල විසින් ඒ - 8 වශයෙන් සලකුණු කර තිබේ. එම ලිපියේ දෙවන

ඡේදයෙන් විශේෂිත වූ කරුණු දෙකක් වගඋත්තරකාර පාර්ශ්වය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙතින් විමසා තිබේ. එනම්

1. ඇයගේ රෝගී තත්ත්වය කොපමණ කාලයකින් සුව වන්නේ ද ?
2. ඇය සේවයට සුදුසු සෞඛ්‍ය තත්ත්වයෙන් පසු වීමට තව කොපමණ කාලයක් ගත වන්නේ ද ?

යනුවෙනි. මෙම ප්‍රශ්න දෙකෙන්ම ගම්‍යමාන වන මූලික කරුණක් වන්නේ වගඋත්තරකාර ආයතනය ඉල්ලුම්කාරියගේ සුවපත් වීම අපේක්ෂා කරමින් අදාළ වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලය වෙත ඇය යොමු කිරීමට කටයුතු කර තිබෙන බවය. එපමණක් ද නොව ඉල්ලුම්කාරියට ඇයගේ පෞද්ගලික නිවාඩු වලට අමතර වශයෙන් 2009.07.07 දින මාසයක කාලයක් විශේෂිත නිවාඩුවක් ද ලබා දී තිබේ. ඇයගේ ඉල්ලීමකින් තොරව හා පිළිගත හැකි වෛද්‍ය සහතික ඉදිරිපත් කිරීමකින් තොරව එවැනි නිවාඩු අනුමත කිරීමක් සාමාන්‍ය නීතිමය තත්ත්වයක් නොවුන ද වගඋත්තරකාර පාර්ශවය ඉල්ලුම්කාරිනියගේ රෝගී භාවය සම්බන්ධයෙන් සාධාරණ ලෙස සලකා බලා තිබෙන බවට එය තවත් එක් සාධයක් ලෙස නිරික්ෂණය කරමි. (එම ලේඛනය ආර් - 01 වශයෙන් සළකුණු කර තිබේ) එම කරුණ වඩාත් තහවුරු වන්නේ ආර් - 2 වශයෙන් සළකුණු කරන ලද 2009.06.30 දිනැති වෛද්‍ය මණ්ඩල වාර්තාවෙනි. එහි දී වෛද්‍ය මණ්ඩලය විසින් සඳහන් කර ඇත්තේ ලබා ගත් නිවාඩු ආවරණය කිරීම නිර්දේශ කරමි'' යනුවෙනි. එහෙත් ඉහත දැක්වෙන නිවාඩු ලබා දී ඇත්තේ ඉන් ඉදිරි කාලය සඳහා ය. මෙහි දී තවදුරටත් සලකා බැලිය යුතු කාරණය වන්නේ ඉල්ලුම්කාරිය වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගන්වනවා වෙනුවට වගඋත්තරකාර පාර්ශවයට වෙනත් විකල්පයක් තිබුණේ ද යන්න පිළිබඳව සළකා බැලීමය. වගඋත්තරකාර පාර්ශවය විසින් සලකුණු කරන ලද අංක 52 ලේඛනයෙන් දැක්වෙන්නේ (එඩී/184/09 දරන හා 2009.06.30 දිනැති වෛද්‍ය මණ්ඩල වාර්තාව) ඉල්ලුම්කාරිය තවදුරටත් සේවයට නුසුදුසු බවත් විශ්‍රාම ව්‍යවස්ථාව යටතේ දීමනා ලැබීමට ඇය සුදුසු බවත් ය. වගඋත්තරකාර ආයතනය සංස්ථා ගත ආයතනයක් බැවින් විශ්‍රාම ගැන්වීමක දී මාසිකව විශ්‍රාම වැටුපක් ලබා දීමේ නෛතික ප්‍රතිපාදන ඊට සළසා නොමැත. එමෙන්ම වෛද්‍ය මණ්ඩල නිර්දේශයක් මගින් ඇය තවදුරටත් සේවය සඳහා නුසුදුසු බවට නිර්දේශ කර තිබිය දී ඇය තවදුරටත් සේවයේ යොදවා ගැනීමට ද වගඋත්තරකාර ආයතනය වෙත නෛතික ප්‍රතිපාදන සැළසී තිබිය නොහැකි ය. එම නිසා වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැන්වීමේ පදනම මත ඇයගේ සේවය 2010.03.01 දින සිට අවසන් කර තිබේ. එසේ සේවය අවසන් කර ඇත්තේ වගඋත්තරකාර ආයතනයේ අවශ්‍යතාවය මත නොවන බව ද ඉතා පැහැදිලි කරුණකි. ඒ අනුව ඉල්ලුම්කාරිය වෛද්‍ය හේතූන් මත පදනම්ව විශ්‍රාම ගැන්වීමෙන් ඇයගේ සේවය අවසන් කරන බව හැරුණු කොට වගඋත්තරකාර ආයතනය සතුව වෙනත් විකල්පයක් පැවති බවක් නොපෙනේ. මෙම තත්ත්වය පැමිණිලිකාර පාර්ශ්වයට හා වගඋත්තරකාර පාර්ශවයට ද කිසිසේත් වළකා ගත හැකි තත්ත්වයක් නොවන අතර වෛද්‍ය මතය අනුව ඇය තවදුරටත් සේවය සඳහා සුදුසු නොවේ නම් ඇයගේ සේවය කුමන නීතිමය පදනමක් යටතේ වුව ද අවසන් විය යුතුව තිබේ.

මීළගට අවධානය යොමු කළ යුතු කාරණය වන්නේ පැමිණිලිකාරිය විශ්‍රාම ගැන්වීමෙන් පසු නැතහොත් ඇයගේ සේවය අවසන් කිරීමෙන් පසු ඇය වෙත හිමිවිය යුතු නීතිමය හිමිකම් ඇය වෙත ලබා දී තිබේ ද යන්න පිළිබඳව සළකා බැලීමය. ඉල්ලුම්කාරිය සංස්ථාගත ආයතනයක සේවිකාවක වශයෙන් ඇයට විශ්‍රාම වැටුපකට හිමිකමක් ඇති වන්නේ නැත. එහෙත් 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ 05(1) වගන්තිය ප්‍රකාරව ඇය පාරිතෝෂික මුදලකට හිමිකම් ලබයි. එහෙත් පාරිතෝෂික පනතේ විධිවිධානයන් යටතේ කටයුතු කිරීම මෙම අධිකරණයේ කාර්ය භාරව නොවුව ද ඇයට පරිතෝෂික දීමනා වශයෙන් රු. 2,56,560.00ක මුදලක් ගෙවා ඇති බවත් ඇය විසින් එම මුදල ලබා ගත් බවත් නඩු විභාගයේ දී හෙළිදරව් විය. (ආර් - 7 ලේඛණය) ඊට අමතර වශයෙන් ආයතනයේ අභ්‍යන්තර විධිවිධාන පරිදි විශ්‍රාමික පාරිතෝෂිකයක් වශයෙන් තවත් රු. 75,000.00ක මුදලක් ඇය වෙත ලබා දී තිබෙන අතර එම මුදල ද ඇයට ලැබුණ බව නඩු විභාගයේදී ඇය පිළිගෙන තිබේ. ඒ හැරුණු විට ඉල්ලම්කාරිනිය වෙත වෙනත් සහන සැලසීම සඳහා අනුමත කාර්ය පරිපාටියක් වගඋත්තරකාර ආයතනය වෙත පැවති බවට කිසිදු සාධකයක් නඩු විභාගයේ දී ඉදිරිපත් නොවීය. පැමිණිලිකාර පාර්ශවය ඒ සම්බන්ධයෙන් හබ කිරීමක් නොකළ අතර ඉල්ලුම්කාරිනියගේ ඉල්ලීම වූයේ ඇයට සේවය කිරීම සඳහා ඉතිරිව තිබූ වසර 15ක පමණ කාලය සඳහා ඇයට මාසිකව හිමිවිය යුතු මූලික වැටුප ගණන් බලා එය ලබා දෙන ලෙස ය. මෙය හුදු ඉල්ලීමකට පමණක් සීමා වූ අතර ඒ සඳහා වූ කිසිදු නෛතික පදනමක් අධිකරණය ඉදිරියේ ගෙන හැර දැක්වීමට ඇය අසමත් වූවා ය. කෙසේ වුව ද වගඋත්තරකාර ආයතනය විසින් ඉල්ලුම්කාරිනිය වෙත සානුකම්පිත දීමනාවක් වශයෙන් සලකා රු. 7,28,190.00ක මුදලක් ඇය වෙත ලබා දී තිබිණි. එම මුදල ඇය විසින් භාර ගන්නා ලද බව ද සාක්ෂි විභාගයේ දී ඉදිරිපත් වූ සාක්ෂි මගින් තහවුරු විය. මෙවන් වූ අවස්ථාවක දී වන්දි මුදලක් ලබා දීම සම්බන්ධයෙන් කිසියම් ක්‍රමවේදයක් හෝ අනුමත පරිපාටියක් වගඋත්තරකාර ආයතනය සතුව නොපැවති බව ඉදිරිපත් වූ කරුණු අනුව පැහැදිලි වුව ද ඉල්ලුම්කාරිය වෙත වන්දි මුදලක් ලබා දීමේ පරමාර්ථයෙන් ඒ සඳහා යම්කිසි නීතිමය රාමුවක් තුළ කටයුතු කිරීමේ වැදගත්කම අවබෝධ කර ගෙන මෙයට අදාළ නොවුවත් 1971 අංක 45 දරන සේවකයන්ගේ සේවය අවසන් කිරීමේ පනත යටතේ ක්‍රියාත්මක වන වන්දි සූත්‍රය උපයෝගී කර ගනිමින් එකී වන්දි මුදල ගණනය කර ඇය වෙත එම මුදල ලබා දීමට පියවර ගෙන තිබේ. ඒ හැරුණු කොට පැමිණිලිකාර පාර්ශවයේ ඉල්ලීම පරිදි ඇයගේ ඉදිරි සේවා කාලය සැළකිල්ලට ගනිමින් ලබමින් සිටි මාසික වැටුප පදනම් කර ගෙන එම මුළු මුදල විශ්‍රාමික දීමනාවක් වශයෙන් හෝ ඇය වෙත ලබා දීමට වගඋත්තරකාර ආයතනයට නීතිමය ප්‍රතිපාදන සැළසී නොමැති බව අධිකරණයේ පිළිගැනීමයි. ඉල්ලුම්කාරියට කිසියම් වූ සහනයක් සැලසීම සඳහා වගඋත්තරකාර ආයතනය යම් නිතිමය රාමුවක් නිර්මාණය කර ගනිමින් හා ඒ තුළ සිටිමින් ඇය වෙත මෙම වන්දි මුදල ගෙවා තිබේ.

මෙම නඩු විභාගයේ දී පැමිණිලිකාරිය විසින් ලබා දෙන ලද සාක්ෂියෙන් ද වගඋත්තරකාර පාර්ශවය විසින් ලබා දෙන ලද සාක්ෂියෙන් ද හෙළිදරව් වූ කරුණු කාරණා මෙන්ම එහි දී ඉදිරිපත් ලිඛිතමය සාධකයන්හි අන්තර් ගතව පැවති තොරතුරු වලින් ද සිදු වූ හෙළිදරව් වීම මත අවසාන වශයෙන් සළකා බැලිය යුත්තේ පැමිණිලිකාරිනියට යම් අසාධාරණයක් සිදු ව තිබේ ද යන්න හා එසේ වී නම් ඇයට හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳවය. ඉල්ලුම්කාරිය වර්ෂ 1993.12.01 දින සිට වර්ෂ 2010.03.03 දින දක්වා අඛණ්ඩව සේවයේ නිරතව සිටි බව නඩු විභාගයේ දී දෙපාර්ශවයම පිළිගෙන තිබේ. ඒ අනුව ඇයගේ මුළු සේවා කාලය වර්ෂ 16 ඉක්මවා තිබේ. ඇය අවසාන වශයෙන් ලද මාසික වැටුප රු. 32,070.00ක් බව ද පාර්ශවයන් හබ කිරීමකින් තොරව පිළිගෙන ඇත. වගඋත්තරකාර පාර්ශවය විසින් ඇය වෙත ගෙවන ලද වන්දි මුදල රු. 7,28,190.00ක් බව ද පාර්ශවයන් පිළිගනී. එය ගණනය කරන ලද්දේ වන්දි සූත්‍රයට අනුව බව වගඋත්තරකාර පාර්ශවයේ ස්ථාවරයයි. සේවය අවසන් කිරීමේ පනත යටතේ ගැනෙන වන්දි සූත්‍රය අනුව වන්දි ගණනය කිරීමට මෙම අධිකරණය වෙත බලතල පැවරී නොතිබුණ ද වගඋත්තරකාර පාර්ශ්වයේ ස්ථාවරය මත පදනම්ව හා ඉල්ලුම්කාරියගේ අවසාන මාසික වැටුප (රු. 25,370.00 + රු. 5,250,00 = රු. 30,620.00) මත සේවා කාලය අනුව වන්දි මුදල ගණනය කළේ නම් ඇය වෙත ලැබිය යුතුව තිබූ මුදල රු. 1,025,770.00කි. එහෙත් ඇය වෙත ගෙවා ඇති මුදල රු. 7,28,190.00කි එම නිසා ගෙවිය යුතුව ඇති හිඟ මුදල රු. 2,97,580.00ක් බවට තීරණය කරමි. එම මුදල ලංකාවේ වලංගු මුදලින් ඉල්ලුම්කාරිය වෙත 2019.11.15 දිනට හෝ ඊට පෙර ඇය වෙත ගෙවීම් සඳහා මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ තැන්පත් කිරීමට මින් නියෝග කරමි. මෙය සාධාරණ හා යුක්ති සහගත වූ තීරණයක් බව ද ප්‍රකාශ කරමි.

එල්. ආර්. සුමතිපාල,
බේරුම්කරු.

11 - 1523

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.